## සෞඛ්‍ය , පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ

## කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණය සඳහා වන

## බඳවා ගැනීමේ පරිපාටිය (විදුලි වෛද්‍ය යාන්ත්‍රික)

**01. සම්බන්ධ වන ආයතන**

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : | යොමු අංකය : | දිනය : |
| 1.2 | අමාත්‍යාංශය : සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය | යොමු අංකය : CB/C/EMT/01/2014-VOL 1 | දිනය :2018.07.09 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය :DMS/0016/33<br>DMS/0016/099<br>DMS/0016/Vol.1<br>DMS/0054 | දිනය :2016.04.05<br>2016.04.06<br>2016.10.10<br>2013.12.31 |
| 1.4 | ආයතනය අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය :EST-2/02/REC/0940 | දිනය : 2017.05.16 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : NSCC/4/13/SR-14 | දිනය : 2017.04.21 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය :PSC/EST/06-01-13/01/2018 | දිනය:2018.05.31 |

**02. පත් කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

**03. සේවා ගණය පිළිබඳ විස්තරය**

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණ බන්ඩ - 03

3.2 ශ්‍රේණි : III, II , I

3.3 පැවරෙන කාර්ය භාරය

පිළිබඳ පොදු නිර්වචනය : " ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුනතාවයන්, එනම් තෘතීයික හා වෘත්තීය කුසලතා (NVQ) මට්ටම පහ (5) යටතට ගැනෙන්නාවූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමිකර ගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත් කිරීම් බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය."

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.

සටහන: විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත්විය යුතුය

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංකය : MT 01 – 2016

5.2 වැටුප් පරිමාණය : රු: 29,840 -10 x 300 – 11 x 350 - 10 x 560 – 10 x 660- රු: 48,890/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු:29,840/- |
| II | පියවර 12 | රු:33,190/- |
| I | පියවර 23 | රු:37,250/- |

**06 සේවා ගණයට අයත් තනතුරු/ තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| විදුලි වෛද්‍ය යාන්ත්‍රික | III<br>II<br>I | 103 | • ආයතනයේ වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කටයුතු වල තම වෘත්තියට අදාල අළුත්වැඩියාවන් ඉටු කිරීම<br>• තමා භාරයේ ඇති යන්ත්‍ර උපකරණ හා මෙවලම්වල වගකීම දැරීම<br>• නියෝග කරනු ලබන පරිදි වෙනත් රජයේ වෛද්‍ය ආයතන වල වෛද්‍ය උපකරණ අළුත් වැඩියාව<br>• ආයතන / අදාල අංශ ප්‍රධානියා විසින් ඔවුන් වෙත පවරනු ලබන අදාල රාජකාරි නොපිරිහෙලා ඉටු කිරීම<br>• වෛද්‍ය උපකරණ භාවිතා කරනු ලබන රෝහල් කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා ඊට සහාය ලබා දීම<br>• වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කිරීමේදී අධිවිදුලිය, විකිරණ, රසායනික ද්‍රව්‍ය, අධිපීඩන හුමාලය ආදියෙන් ආරක්ෂාවීම සඳහා අදාල ආරක්ෂක පියවර අනුගමනය කිරීම.<br>• අංශ ප්‍රධාන ඉංජිනේරු/අධ්‍යක්ෂක/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) විසින් පවරනු ලබන අදාල වෙනත් රාජකාරීන් ඉටු කිරීම. |

**6.2** ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 103

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II , I සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාල නොවේ |

### 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්:

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්: : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම්: : තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටම ඇතුළත්වන්නාවූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

7.2.2.3 පළපුරුද්ද: : අදාළ ක්ෂේත්‍ර යේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.4 කායික සුදුසුකම්: : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත්: : I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින්ද යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය

7.2.3 වයස :

7.2.3.1 අවම වයස් සීමාව : අවුරුදු 18ට නොඅඩු
7.2.3.2 උපරිම වයස් සීමාව : අවුරුදු 35ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වන අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම් කරුවන් අතුරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම් කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : (ඇමුණුම 01)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | 100% | 40% |

7.2.4.1.1 පවත්වන බලධරයා : සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| තනතුරට අදාල දැනුම පිළිබඳ පරීක්ෂණය | 100% | 40% |

7.2.4.2.1 පවත්වන බලධරයා : සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය: මෙම පරීක්ෂණයේදීම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: ප්‍රසිද්ධ දැන්වීමක් මගින් හෝ අභ්‍යන්තර නිවේදනයක් මගින් හා වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3 සීමිත බඳවා ගැනීම:**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්:

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම්: : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම

7.3.2.2. වෘත්තීය සුදුසුකම්: : තනතුරෙහි කාර්යභාරයට අදාළවතෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටම ඇතුළත්වන්නාවූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම

7.3.2.3 පළපුරුද්ද: : PL-01, PL-02, PL-03 යන වැටුප් කේත යටතේ අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත්: : I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින්ද යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 සිට 7.3.3 දක්වා සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය

**7.3.3** වයස : අදාළ නොවේ.

**7.3.4** බඳවා ගැනීමේ ක්‍රමය: යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම් කරුවන් අතුරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම් කරුවන් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු සහ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය (ඇමුණුම 02)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| තනතුරට අදාළ විෂය දැනුම | 100% | 40% |

7.3.4.2.1 පවත්වන බලධරයා : සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ.

7.3.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය: (ඇමුණුම 03)

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. පෝෂ්‍යත්වය | 40 | අදාල නොවේ |
| 2. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 35 | |
| 3. තනතුරට අදාල පලපුරුද්ද | 20 | |
| 4. සම්මුඛ පරීක්ෂණය | 05 | |

7.3.4.4.1 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය පත්කරන බලධාරියා: සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: ප්‍රසිද්ධ දැන්වීමක් මගින් හෝ අභ්‍යන්තර නිවේදනයක් මගින් හා වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.4** කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය |

(විෂය නිර්දේශයන් සඳහා ඇමුණුම 04, 05, හා 06 දක්වේ)

8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම

— සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

09. භාෂා ප්‍රවීණතාව :

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුල ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම :

10.1 III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව.

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
vi. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්වීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

## 10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

### 10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව.

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සටහන: සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුවඋසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

**11.** තනතුරු වලට පත් කිරීම : අදාල නොවේ.

**12.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

I. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියළුම පත් කිරීම් / බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට අනුකූල වන පරිදි පමණක් විය යුතුය.

II. බඳවා ගැනීම්, සේවයේ යෙදවීම්, විනය හා අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ කොන්දේසි / රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති I කාණ්ඩයේ විධිවිධාන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන විධි වධාන අදාළවේ.

**13.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන : ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතු වූවන් සඳහා පමණක් අදාල වේ. (ඇමුණුම -07)

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධි විධාන : අදාළ නොවේ.

| | |
|---|---|
| සකස් කළේ අත්සන : ........................................ | පරීක්ෂා කළේ අත්සන : ........................................ |
| (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා) | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා) |
| නම : සම්පත් ඉඩම්ගොඩගේ | නම : ඩබ්. ඒ. ඩී. කරුණාතිලක, |
| තනතුර : අධ්‍යක්ෂ (පාලන) 05, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. |
| දිනය : 26/07/2018 | දිනය : 2018.07.30 |

---

යොමු අංකය : CB/C/EMT/01/2014 – VOL - 1

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බන්ධය - 3 සේවා ගණයේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා 2018.05.31 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

බී. ජී. එස්. ගුණතිලක
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන : ........................................
නම : ........................................
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

දිනය : 2018/08/02

නිල මුද්‍රාව : ........................................

---

යොමු අංකය : PSC/EST/06-01-13/01/2018

සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බන්ධය - 3 සේවා ගණයේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය 2018.05.31 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ........................................
නම : එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2018.08.16

නිල මුද්‍රාව : එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

## ඇමුණුම - 01

### ලිඛිත විභාගය හා ප්‍රායෝගික පරීක්ෂණය

01. විභාගයේ නම : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර III සඳහා බඳවා ගැනීමේ ලිඛිත විභාගය හා ප්‍රායෝගික පරීක්ෂණය

02. ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍රය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | පැය 02කි. | 100% | 40% |
| ප්‍රායෝගික පරීක්ෂණය | පැය 02කි. | 100% | 40% |

03. ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වනු ලබන නිලධරයා : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය අනුව පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සීතීමේ තර්කානුකූලභාවයෙන් , ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියත් , විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | ධාරා විද්‍යුතය - සරල ධාරා විද්‍යුතය, ඕම්ගේ නියමය, කර්චෝෆ් නියමය, විභව අන්තරය, ධාරාව මැනීමේ ක්‍රම.<br>චුම්භකත්වය -විද්‍යුත් චුම්භකත්වය<br>ස්ථිතික විද්‍යුතය - කුලෝම් නියමය<br>තරංග - විද්‍යුත් චුම්භක තරංග<br>ඉලෙක්ට්‍රෝනික භෞතික විද්‍යාව - අර්ධ සන්නායක ඩයෝඩ සහ ට්‍රාන්සිස්ටර් තපය - ප්‍රසාරණය, රේඛීය ප්‍රසාරණතා සංගුණකය<br>ගණිතය - ත්‍රිකෝණමිතික ශ්‍රිත, නිව්ටන් භෞතික විද්‍යාව,<br>විදුලි යන්ත්‍ර (D.C මෝටර්, A.C මෝටර්, විදුලි පරිණාමක) |

සකස් කළේ අත්සන : C.K. D... 
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : ඩී. එම්. සී. කේ. දිසානායක
තනතුර : අධ්‍යක්ෂ (පාලන) 04, "සුවසිරිපාය", සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ 10.
දිනය : 2018.07.02

පරීක්ෂා කළේ අත්සන ....
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : ඩබ්. ඒ. ඩී. කරුණාතිලක,
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.
දිනය : 2018.07.03

අත්සන : .... (අමාත්‍යාංශයේ ලේකම්)
නම : ජනක සුගතදාස
තනතුර : ලේකම්, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.
දිනය : 2018/07/04
නිලමුද්‍රාව: ....

ඇමුණුම - 02

**සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බන්ධය - 3 සේවා ගණය**

**විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා වෘත්තීය පරීක්ෂණය**

01. විභාගයේ නම : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර III සඳහා බඳවා ගැනීමේ වෘත්තීය පරීක්ෂණය

02. ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍රය :

| විෂයයන් | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ක්ෂේත්‍රයට අදාල මූලික දැනුම , උපකරණ සවිකිරීම , අලුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම , අදාල ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනා ගැනීම , ක්ෂේත්‍රයට අදාල උපකරණ භාවිතය පිළබඳ දැනුම | පැය 01, විනාඩි 30යි. | 100% | 40% |

03. වෘත්තිය පරීක්ෂණ පවත්වන ලබන නිලධරයා : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය අනුව පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විදුලි වෛද්‍ය යාන්ත්‍රික විෂය දැනුම | එකලා මෝටර්, තෙකලා මෝටර්, සරලධාරා මෝටර්, තෙකලා තාපන දඟර, ඔසිලස් කෝප් භාවිතය ස්ටාර් ඩෙල්ටා පරිපත, ජව සැපයුම් පරිපත |

සකස් කළේ අත්සන : ..........................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ඩී. එම්. ඩී. ගේ. දිසානායක
අධ්‍යක්ෂ (සැලසුම්) 04
"සුවසිරිපාය"
සෞඛ්‍ය අමාත්‍යාංශය

තනතුර :

දිනය : 2018 . 07 . 02

පරීක්ෂා කළේ අත්සන : ..........................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

ඩබ්. ඒ. ඩී. කරුණාතිලක,

නම : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) I,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",

තනතුර : 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය : 2018 . 07 . 03

අත්සන : ..........................

(අමාත්‍යාංශයේ ලේකම්)

ජනක සුගතදාස
ලේකම්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

නම :

තනතුර :

දිනය : 2018/07/04

නිලමුද්‍රාව: ..........................

ඇමුණුම - 03

**සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බන්ධය - 3 සේවා ගණය**

**විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

01. විභාගයේ නම : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර III සඳහා බඳවා ගැනීමේ යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

02. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට අදාල කරුණු

03. ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍රය : ලකුණු

i. ජ්‍යෙෂ්ඨත්වය 40

අවවාද කිරීමක් හැර වෙනත් කිසිදු විනය දඬුවමක් නොලබා ඇති හා වැටුප් වර්ධක නිසි පරිදි උපයාගෙනන ඇති සතුටුදායක සේවා කාලයක් ඇති

සෑම වර්ෂයක් වෙනුවෙන්ම ලකුණු 04

මාස 12ට අඩු හා මාස 09ට වැඩි ලකුණු 03ක් ද

මාස 09ට අඩු හා මාස 06ට වැඩි ලකුණු 02ක් ද

මාස 06ට අඩු හා මාස 03ට වැඩි ලකුණු 01ක්ද

වශයෙන් උපරිම ලකුණු 40 දෙනු ලැබේ.

සටහන : දඬුවම් ලබා ඇති වර්ෂ වෙනුවෙන් හා වැටුප් වර්ධක නිසි පරිදි උපයාගෙන නොමැති වර්ෂ වෙනුවෙන් ලකුණු හිමි නොවේ.

ii. යෝජිත අධ්‍යාපන සුදුසුකම් වලට වඩා වැඩි අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 35

අ. එකවර විෂයයන් 06ක් සහිතව ලැබූ මූලික සුදුසුකම් වලට අමතරව අ.පො.ස.(සා.පෙ.) /ජා.අ.පො.ස. විභාගයේදී විෂයයන් සඳහා ලැබූ

එක් සාමාන්‍ය සාමාර්ථයක් සඳහා ලකුණු 01 බැගින් ද

සම්මාන සාමාර්ථයක් සඳහා ලකුණු 02 බැගින් ද

විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා ලකුණු 03 බැගින්ද

උපරිම වශයෙන් විෂයයන් 06 සඳහා 18

ආ. අ.පො.ස.(සා.පෙ.) /ජා.අ.පො.ස. විභාගයෙන් ඉංග්‍රීසි විෂයය සමත්වීම සඳහා 02

ඇ. අ.පො.ස.(උ.පෙ.) විභාගයේදී

එකවරකදී විෂයයන් 03ක් සමත්වීම සඳහා උපරිම 15

විෂයයන් 02ක් වෙනුවෙන් ලකුණු 10

එක් විෂයක් වෙනුවෙන් ලකුණු 05

iii. තනතුරට අදාල පළපුරුද්ද 20

අ. රජයේ රෝහලක හෝ පෞද්ගලික ආයතනයක තනතුරට අදාල දැනුම වසර 01 හෝ ඊට වැඩි කාලයක පළපුරුද්ද සඳහා වසරකට ලකුණු 02 බැගින්

04. සම්මුඛ පරීක්ෂණය සඳහා 05

එකතුව 100

05. වෘත්තිය පරීක්ෂණ පවත්වන ලබන නිලධරයා : **සෞඛ්‍ය , පෝෂණ** හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්.

06. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : **පුරප්පාඩු සම්පූර්ණ** කිරීමේ අවශ්‍යතාවය අනුව පවත්වනු ලැබේ.

07. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| **ප්‍රශ්න පත්‍රයේ නම** | **විෂය නිර්දේශය** |
|---|---|
| විදුලි වෛද්‍ය යාන්ත්‍රික විෂය දැනුම | එකලා මෝටර්, තෙකලා මෝටර්, සරලධාරා මෝටර්, තෙකලා තාපන දඟර, **ඔසිලස් කෝප් භාවිතය ස්ටාර් ඩෙල්ටා පරිපත, ජව සැපයුම් පරිපත** |

සකස් කළේ අත්සන : C.K. Dissa...............................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ඩී. එම්. සී. ජේ. දිසානායක

තනතුර : [illegible] 04 "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශය කොළඹ 10.

දිනය : 2018.07.02

පරීක්ෂා කළේ අත්සන : .............................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ඩබ්. ඒ. ඩී. කරුණාතිලක,

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය : 2018.07.03

අත්සන : .............................................

(අමාත්‍යාංශයේ ලේකම්)

නම : ජනක සුගතදාස

තනතුර : ලේකම් සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය : 2018/07/04

නිලමුද්‍රාව: .............................................

ඇමුණුම - 04

## I කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි විදුලි වෛද්‍ය යාන්ත්‍රික III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්යාල පරිපාලන හා ආයතන සංග්‍රහය | පැය 02කි. | 100 | 40 |
| මුදල රෙගුලාසි | පැය 02කි. | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල පරිපාලන | රාජකාරි කටයුතු පිළිබඳ දැනුම<br>ආයතනයේ සේවාවන් පිළිබඳ හා කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම |
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ පහත පරිච්ඡේද පිළිබඳ දැනුම<br>II පරිච්ඡේදය<br>III පරිච්ඡේදය<br>IV පරිච්ඡේදය<br>V පරිච්ඡේදය<br>VII පරිච්ඡේදය<br>VIII පරිච්ඡේදය<br>XII පරිච්ඡේදය<br>XIII පරිච්ඡේදය<br>XIV පරිච්ඡේදය<br>XIX පරිච්ඡේදය<br>XXIX පරිච්ඡේදය |
| මුදල් රෙගුලාසි | I පරිච්ඡේදය<br>වියදම් හා ඇස්තමේන්තු<br>III වන පරිච්ඡේදය |

අත්සන : 2018.07.03

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :.................................................

තනතුර : ................... ඩබ්. ඒ. ඩී. කරුණාතිලක,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I,

දිනය : ........................ සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,

"සුවසිරිපාය",

නිලමුද්‍රාව:................ 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,

කොළඹ 10.

ඇමුණුම - 05

II කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි විදුලි වෛද්‍ය යාන්ත්‍රික II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්යාල පරිපාලන හා ආයතන සංග්‍රහය | පැය 02කි. | 100 | 40 |
| මුදල රෙගුලාසි | පැය 02කි. | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල පරිපාලන | රාජකාරි කටයුතු පිළිබඳ දැනුම<br>ආයතනයේ සේවාවන් පිළිබඳ හා කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම |
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ පහත පරිච්ඡේද පිළිබඳ දැනුම<br>XV වන පරිච්ඡේදය<br>XVI වන පරිච්ඡේදය<br>XXIII වන පරිච්ඡේදය<br>XXIV වන පරිච්ඡේදය<br>XXV වන පරිච්ඡේදය<br>XXVII වන පරිච්ඡේදය<br>XXVIII වන පරිච්ඡේදය<br>XXX වන පරිච්ඡේදය<br>XXXIII වන පරිච්ඡේදය<br>XLVII වන පරිච්ඡේදය<br>XLVIII වන පරිච්ඡේදය |
| මුදල් රෙගුලාසි | VI වන පරිච්ඡේදය<br>XIII වන පරිච්ඡේදය |

අත්සන : 2018.07.03

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :

තනතුර : ඩබ්. ඩී. ඩී. කරුණාතිලක,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,

දිනය :

"සුවසිරිපාය",
නිලමුද්‍රාව: 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම - 06

II කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශයෙහි විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරේ නිලධාරීන් සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

03.

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්යාල පරිපාලන හා ආයතන සංග්‍රහය | පැය 02කි. | 100 | 40 |
| මුදල රෙගුලාසි | පැය 02කි. | 100 | 40 |

04. පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

05. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

06. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල පරිපාලන | රාජකාරි කටයුතු පිළිබඳ දැනුම<br>ආයතනයේ සේවාවන් පිළිබඳ හා කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම |
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ පහත පරිච්ඡේද පිළිබඳ දැනුම<br>II වන පරිච්ඡේදය XXX වන පරිච්ඡේදය<br>III වන පරිච්ඡේදය XXIII වන පරිච්ඡේදය<br>IV වන පරිච්ඡේදය XXIV වන පරිච්ඡේදය<br>V වන පරිච්ඡේදය XXV වන පරිච්ඡේදය<br>VIII වන පරිච්ඡේදය XXVII වන පරිච්ඡේදය<br>XII වන පරිච්ඡේදය XXVIII වන පරිච්ඡේදය<br>XIII වන පරිච්ඡේදය XXXIII වන පරිච්ඡේදය<br>XIV වන පරිච්ඡේදය XLVII වන පරිච්ඡේදය<br>XV වන පරිච්ඡේදය XLVIII වන පරිච්ඡේදය |
| මුදල් රෙගුලාසි | I වන පරිච්ඡේදය<br>III වන පරිච්ඡේදය<br>VI වන පරිච්ඡේදය<br>XIII වන පරිච්ඡේදය |

අත්සන : 2018.07.03

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :.............................................

තනතුර : .........................................

දිනය : .........................................

නිලමුද්‍රාව:.....................................

ඩබ්. ඒ. ඩී. කරුණාතිලක,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

(ඇමුණුම -07)

<u>සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම.</u>

<u>(මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ.)</u>

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 මඟින් ලබා දී ඇති PL-03 -2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබමින් විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරේ සේවය කරන සියළු දෙනාම නව බඳවාගැනිමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ලබා සිටි 2016 අනුරූපී වැටුප් පරිමාණය පරිදි අදාල ශ්‍රේණිය /සේවා කාලය පදනම් කොට ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 4 වගන්තියේ වැටුප සකස් කිරීමේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වුවද , අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර , එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

**(I) MT – 01 –III ශ්‍රේණිය**

(අ) PL-03 -2006 A වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත්පිරිසෙයින් අවුරුදු දහය (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධරයින් ,

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියට යටත් පිරිසෙයින් අවුරුදු 10ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද පෙර බඳවා ගැනීමේ පරිපාටිය යටතේ II ශ්‍රේණියට (PL-03) උසස් කිරිම අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයින් ,

MT – 01 –III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

**(II) MT – 01 –II ශ්‍රේණිය**

(අ) PL-03 -2006 A වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත්පිරිසෙයින් අවුරුදු දහය (10) ක හෝ ඊට වැඩි එහෙත් අවුරුදු විස්ස(20)කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අවම වශයෙන් අවුරුදු දහය (10)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක දහය(10)ක උපයාගෙන ඇති හා නව බඳවාගැනිම් පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවාගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයින් ,

(ආ) PL-03 -2006 A වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධරයින් ,

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියට සේවා කාලය අවුරුදු 10 සම්පූර්ණ වුවද නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවාගැනීමේ පරිපාටිය අනුව I ශ්‍රේණියට උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයින්,

MT – 01 –II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

(I) **MT – 01 – I ශ්‍රේණිය**

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු විස්ස (20) ක හෝ ඊට වැඩි එහෙත් අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාල කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක විස්ස(20)ක් උපයාගෙන ඇති හා නව බඳවාගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවාගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයින්,

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියට යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක හෝ ඊට වැඩි එහෙත් අවුරුදු විස්ස (20) කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක නවය(09)ක් උපයාගෙන ඇති හා නව බඳවාගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවාගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයින් ,

(ඇ) PL-03 -2006 A වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධරයින් ,

(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු 09 සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයින් ,

(ඇ) PL-03 -2006 A වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක දැනටමත් සේවයේ නියුතු නිලධරයින්,

MT – 01 –I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

| | |
|---|---|
| සකස් කළේ අත්සන : ...........(signature) | පරීක්ෂා කළේ අත්සන: ...........(signature) |
| (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා) | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා) |
| නම : ඩී. එම්. සී. කේ. දිසානායක | නම : ඩබ්. ඒ. ඩී. කරුණාතිලක, |
| තනතුර : අධ්‍යක්ෂ (ආයතන) 04 "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශය කොළඹ 10. | තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. |
| දිනය : 2018.07.02 | දිනය : 2018.07.03 |

අත්සන : ...........(signature)

(අමාත්‍යාංශයේ ලේකම්)

නම : ජනක සුගතදාස

තනතුර : ලේකම් සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

නිලමුද්‍රාව: ..........................................

2018/07/04